**ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරන විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 896.43 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 863.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 33.20 ක් හෙවත් සියයට 3.70 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| **පුනරාවර්තන** | 299.78 | 299.08 | 0.70 | 0.23 |
| **මූලධන** | 596.65 | 564.15 | 32.50 | 5.45 |
| **එකතුව** | **896.43** | **863.23** | **33.20** | **3.70** |

## 2.2 අත්තිකාරම් ගිණුම

---------------------

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

--------------------------------------------

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

---------------------------------------------------

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 16.00 | 12.43 | 10.60 | 13.61 | 65.00 | 45.99 |

## 2.3 අග්‍රිම ගිණුම

---------------

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0146/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 72.03 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

-----------------------

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 1,934.70 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0015/0149/000 | 0.07 |
| 6000/0000/00/0002/0125/000 | 5.79 |
| 6000/0000/00/0016/0074/000 | 86.04 |
| 6000/0000/00/0006/0026/000 | 1,842.49 |
| 6000/0000/00/0018/0081/000 | 0.31 |
| **එකතුව** | **1,934.70** |

**2.5 විගණන නිරීක්ෂණය**

---------------------

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරන විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**3.2 විසර්ජන ගිණුම**

------------------

**අයවැය විචලනය**

------------------

**වැය විෂයයක් යටතේ සලසා තිබුණු රු.500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.**

**3.3 අග්‍රිම ගිණුම**

--------------

දෙපාර්තමේන්තුවේ පොත් අනුව 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.72,302,697 ක් වී තිබුණත්, එදිනට හර නිවේදනවල සඳහන් කර තිබුණු භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ මුදල රු.72,279,296.65 ක් පමණක් වී තිබුණි. ඒ අනුව රු.23,400 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

-----------------------

වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.29,394,997 ක් වූ තැන්පතු 107 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

විෂය අංක 29401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.1,586,703 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**විගණන හා කළමනාකරණ කමිටුව**

2015 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.7 වත්කම් කළමණාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2015 වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුවේ සිව්පාවුන්, කුරුල්ලන්, මත්සායින් සහ උරගයින් සම්බන්ධ සමීක්ෂණ පවත්වා, එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX පරිච්ඡේදයේ 3 වගන්තිය | - | සියලුම රජයේ නිවාස ඒවා ලැබීමට සුදුසුකම් ඇති නිලධාරී පංතිවලට අනුව ශ්‍රේණිගත කර නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | - | රජයේ සේවයේ නියුතු වූ අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචි වී සිටින අවස්ථාවලදී කලත්‍රයාගේ වැටුපෙන් සියයට 5 ක් අයකර නොතිබුණි. |
| (iii) XIX පරිච්ඡේදයේ 5.8 වගන්තිය | - | රජයේ නිවාසවල පදිංචි රජයේ නිලධාරියා විසින් ජලය සහ විදුලි බලය සඳහා ගාස්තු සෘජුවම ගෙවා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | - | රජයේ නිවාස සඳහා වන බදු කාලය වර්ෂ 5 ක් වුවත්, නිලධාරීන් 13 දෙනෙකු එම කාලය ඉක්මවා රජයේ නිවාසවල පදිංචිව සිටිති. |
| (v) | XIX පරිච්ඡේදයේ 5.5.1 උපවගන්තිය | - | සෑම හවුල් පදිංචිකරුවකුගෙන්ම වැටුපෙන් සියයට 10 ක් බැගින් අයකර නොතිබුණි. |

**(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**

| | | | |
|---|---|---|---|
| (i) | 4.3.1 මාර්ගෝපදේශය | 5,293,035 | ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව ජල පෙරන පද්ධතියක් ඉදිකර තිබුණි. |
| (ii) | 8.9.3 මාර්ගෝපදේශය | - | කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව ජල පෙරන පද්ධතිය ඉදිකිරීම සඳහා රාජ්‍ය ආයතනයකට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. |

## 3.9 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) දෙහිවල සත්වෝද්‍යානයේ බෙංගාල කොටි අරණ සහ බළල් පවුලේ සාමාජිකයන් සඳහා අරණ ඉදිකිරීම 2015 ජනවාරි 15 දින ආරම්භ කර 2015 ජූනි 30 දින අවසන් කළ යුතු බව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 30 ක් ලෙස දක්වා තිබුණි. නමුත් 2015 දෙසැම්බර් 31 දින වන විට එයින් සියයට 80 ක් පමණක් නිමකර තිබුණි. එදිනට සමුච්චිත වියදම රු.මිලියන 42.5 ක් වී තිබුණි. ව්‍යාපෘතිය 2015 ජූනි 30 දින නිම කළ යුතුව තිබුණත්, එම ඉදිකිරීම 2016 ජූනි 30 දින අවසන් කර තිබුණි.

(ii) දෙහිවල සත්වෝද්‍යානයේ උරග උයන නවීකරණය 2015 ජූලි 15 දින ආරම්භ කර 2015 දෙසැම්බර් 15 දින අවසන් කළ යුතු වුවත්, 2015 දෙසැම්බර් 31 දින වන විට ඉන් සියයට 40 ක පමණ වැඩ කොටසක් නිම කර තිබුණි.

(iii) දෙහිවල සත්වෝද්‍යානයේ විදේශීය කුරුළු උයන නවීකරණය 2015 මැයි 15 දින ආරම්භ කර 2015 නොවැම්බර් 30 දින අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී එයින් සියයට 50 ක් පමණක් අවසන් කර තිබුණි.

(iv) දෙහිවල සත්වෝද්‍යානයේ කුණු දමනය අළුත්වැඩියාව 2014 වර්ෂයේ සිට සිදු කෙරෙමින් පැවතුණද, 2015 වර්ෂය අවසන් වන විට එයින් සියයට 65 ක් පමණක් අවසන් කර තිබුණි. එම ඉදිකිරීම් 2016 ජූලි 07 දින අවසන් කර තිබුණි.

(v) බෙංගාල කොටි අරණ, දිවි සහ වලස් අරණ 2015 දෙසැම්බර් මාසය ආරම්භයේදී ආරම්භ කළ යුතුව තිබුණි. නමුත් එම ව්‍යාපෘතීන් දෙක 2015 වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු කාර්යයන්

---

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබූ පහත ව්‍යාපෘතීන් 2015 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ බව කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.

**(i).** **දෙහිවල සත්වෝද්‍යානය**

---

**පහත සඳහන් කාර්යයන් ඉටු කර තිබුණි.**

- අභ්‍යන්තර මාර්ග අංක 06 නවීකරණය කිරිම සඳහා රු.මිලියන 26.2 ක් වැයකර තිබුණි.
- තාරාවුන් සඳහා අරණ, සේවා මාර්ගය, සේවක රථගාල සහ වැසිකිළි පද්ධතිය රු.මිලියන 5.7 ක් වැය කර නිම කර තිබුණි.
- වඳුරු කූඩු සැකසීම සඳහා රු.මිලියන 2.2 ක් වැය කර තිබුණි.

**(ii).** **පින්නවල අලි අනාථාගාරය**

---

**පහත සඳහන් කාර්යයන් ඉටු කර තිබුණි.**

- තෝරා ගත් අභ්‍යන්තර මාර්ග කිහිපයක් නවීකරණය.
- වැව ප්‍රතිසංස්කරණය කිරිම.
- සුහසාධක ආපනශාලාව අවට ප්‍රදේශය නවීකරණය කිරිම.
- කාර්යාලය අසල මායිම් තාප්පය ඉදිකිරීම.

**(iii).** **හම්බන්තොට සෆාරි උද්‍යානය**

---

**පහත සඳහන් කාර්යයන් ඉටු කර තිබුණි.**

- ගරාජය ඉදි කිරිම.
- සිංහ ලෙන් හා සත්ව භාරකරුවන් සඳහා කුටි ඉදි කිරීම.

## 3.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ ශීර්ෂය යටතේ රු.මිලියන 5 ක් ගෙවා සෆාරි උද්‍යානය සඳහා පැස්බරුන් හතර දෙනෙකු මිලදී ගෙන තිබුණි. එකී සතුන් අලෙවිය සඳහා වූ වෙළඳ බලපත්‍රය සැපයුම්කරු විසින් ඉදිරිපත් කර නොතිබුණි. එසේම 2015 ජුලි 24 දිනැති අංක LP/H/ZDWF/01/14/42 දරන විගණකාධිපති වාර්තාවේ 4.4(iii) ඡේදයට අදාළ පිළිතුරු සමග ඉදිරිපත් කළ බලපත්‍රයේ වලංගු කාලය මාස 03 ක් සහිත 2012 ජුලි 12 දිනැතිව, සතුන් වර්ග 3 ක් ආනයනය සඳහා නිකුත් කළ ආනයන බලපත්‍රයකි. එකී බලපත්‍රයේ සඳහන් පරිදි සතුන් වර්ෂ 2 ක් වයසැති පැස්බරුන් සඳහා මිල කියුමේ අවස්ථාව වන විට එකී සතුන්ගේ වයස අවු.03 ක් ඉක්ම වුවද, එහි වයස අවු.2 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මිලදී ගත් සතුන්ගේ වයස සහ ආනයන බලපත්‍රයට අදාළ පැස්බරුන්ගේ වයස්වල පරස්පරතාවයක් නිරීක්ෂණය විය.

## 3.11 හානි හා පාඩු

සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුවේ සත්ව මරණ සහ ඊට අදාළ සත්ව වටිනාකම් ගණනය කර පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

## 3.12 අනාර්ථික ගනුදෙනු

දෙපාර්තමේන්තුවේ හඳුනාගත් දෛනික අවශ්‍යතාවයට අමතරව රු.126,500 ක් වටිනා ඇඹිලි සළකුණු යන්ත්‍ර 02 ක් මිලදීගෙන ගබඩාගත කර තිබුණි. විගණිත දිනය වූ 2016 ජුලි 08 දින වන විට මෙම යන්ත්‍රවල එක් වර්ෂයක වගකීම් කාලයද ඉක්මගොස් තිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 21 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්මට | 162 | 128 | 34 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 667 | 417 | 250 |
| | **එකතුව** | **859** | **567** | **292** |

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් පුරප්පාඩු 292 ක් පැවතී තිබුණි. එම පුරප්පාඩුවලින් වැඩිම සංඛ්‍යාවක් සත්වයන් රැකබලා ගැනීමේ කාර්යයට අදාළවද පුරප්පාඩු 61 ක් සත්වයන්ගේ සෞඛ්‍ය, පෝෂණය සහ සත්ව පාලනය සම්බන්ධ තනතුරුවලට සෘජුවම සම්බන්ධ වන පුරප්පාඩු බව විගණනයේදී නිරීක්ෂණය විය.